නිකුත් කිරීම: 2024 පෙබරවාරි

අනුක්‍රමික අංක: 25/24

කෘමී, මයිටා සහ වටපනු පළිබෝධකයන්ගේ රසායනික පාලනය

(මෙම උපදෙස් චක්‍රලේඛය මඟින් 2023 මාර්තුමාසයේදී නිකුත් කරන ලද අනුක්‍රමික අංක 04/23, PU4 උපදෙස් චක්‍රලේඛය සහ එයට අදාල පෙර උපදෙස් චක්‍රලේඛ ප්‍රතිස්ථාපනය වන අතර මෙය 2024 පෙබරවාරි මාසයේදී නිකුත් කරන ලද PM 2, PM 3, PM 4, PM 6, PM 7, PM 9, PM 10 සහ PM 11 යන උපදෙස් චක්‍රලේඛ හා සබැඳේ.)

මෙම චක්‍රලේඛයෙහි තේ පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත කෘමිනාශක, මයිටානාශක, ධූමකාරක සහ වටපනුනාශකවල ක්‍රියාකාරී ද්‍රව්‍ය (a.i.) සමඟ ඒවායේවෙළඳ නාම, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වරයා (ROP) ඒවාට ලබාදී ඇති ලියාපදිංචි අංක, මාත්‍රාවන්/අනුපාත, යොදන ආකාරය සහ පෙර අස්වනු නෙලීමේ විරාම කාල පරතරයන් (PHI) ලබා දී ඇත.

ආහාර හා පාන පිළිබඳ වෙළඳපල සීමාවන්, යොදන පිරිවැයට ඇති ඵලදායීතාවය සහ සමාජ පිළිගැනීම හා පාරිසරික හිතකරභාවය ආදී හේතූන් නිසා නිර්දේශිත රසායනික ද්‍රව්‍ය සහ තේ ඉඩම් හි ඒවායේ භාවිතයන් වරින් වර වෙනස් වේ.

1. වටපනු පාලනය

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාම/ය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	වෙනත් කරුණු	PHI (සති)
තවාන් ධූමකරණය					
මෙතිල් අයිසෝතියොසයනේට් /මෙතම් Methylisothiocyanate / Metam	මෙතම් සෝඩියම්	D340000	එක් පස් කියුබයක් සඳහා රසායනිකය මි.ලී 800 ක්	පිළියෙල කල පස් ගොඩ මතුපිට රසායනිකය ඒකාකාරව ඉසීමෙන් අනතුරුව ඒ සැනින් පස සමග මිශ්‍ර කරන්න. ක්‍රමවේදය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහා කරුණාකර උපදෙස් චක්‍රලේඛ PM 11 බලන්න	අදාල නැත
පැල සිටුවීමේදී ගත යුතු පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග					
ෆ්ලූඔපිරාම් Fluopyram	වෙලම් 400 SC	P060000	හෙක්ටයාරයකට ලීටර් 2ක් ජලය ලීටර් 500 ක (පැලයකට ද්‍රාවණයෙන් මිලි ලීටර් 40 ක්)	පැල සිටුවීමෙන් පසු, පස හොඳින් තෙමෙන සේ ද්‍රාවණය යොදන්න	අදාල නැත
මේරූ තේ ක්ෂේත්‍රයන්හි කප්පාදුවෙන් පසු ගත යුතු පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග					
ෆ්ලූඔපිරාම් Fluopyram	වෙලම් 400 SC	P060000	හෙක්ටයාරයකට ලීටර් 2.5 ක් ජලය ලීටර් 1000 ක (පඳුරකට ද්‍රාවණයෙන් මිලි ලීටර් 80 ක්)	මට්ටම් කපන අවස්ථාවේදී, පස හොඳින් තෙමෙන සේ ද්‍රාවණය යොදන්න	අදාල නැත

2.ටී ටෝට්‍රික්ස් පාලනය

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	PHI (සති)
තේ තවාන් පැළ සඳහා				
ඉම්මෙක්ටින් බෙන්සෝඒට් Emamectin Benzoate	ප්‍රෝක්ලේම් 5 SG	H350000	0.028% ද්‍රාවණයක් (ග්‍රෑම් 2.8 ක් ජලය ලීටර් 10 ක) නැප්සැක් ඉසිනයක් භාවිතයෙන් පැල 1000 ක් සඳහා ද්‍රාවණයෙන් ලීටර් 2 - 4 ක්	අදාල නැත
දළු නෙලීම ආරම්භ නොකල ළපටි තේ වගාවන් සහ කප්පාදු කිරීමෙන් පසු නැවත වැඩෙන තේ වගාවන් සඳහා				
ඉම්මෙක්ටින් බෙන්සෝඒට් Emamectin Benzoate	ප්‍රෝක්ලේම් 5 SG	H350000	0.028% ද්‍රාවණයක් (ග්‍රෑම් 2.8 ක් ජලය ලීටර් 10 ක) නැප්සැක් ඉසිනයක් භාවිතයෙන් හෙක්ටයාරයක් සඳහා ග්‍රෑම් 140 ක් ජලය ලීටර් 500 ක	අදාල නැත
මේරූ තේ ක්ෂේත්‍ර සඳහා				
ඉම්මෙක්ටින් බෙන්සෝඒට් Emamectin Benzoate	ප්‍රෝක්ලේම් 5 SG	H350000	0.028% ද්‍රාවණයක් (ග්‍රෑම් 2.8 ක් ජලය ලීටර් 10 ක) නැප්සැක් ඉසිනයක් භාවිතයෙන් හෙක්ටයාරයක් සඳහා ග්‍රෑම් 252 ක් ජලය ලීටර් 900 ක	2

3. මයිටාවන් පාලනය

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	PHI (සති)
තවාන් පැළ සඳහා				
සල්ෆර් 80% Sulphur 80%	බවර්ස් S	5940100	0.5% ද්‍රාවණයක් (ග්‍රෑම් 5 ක් ජලය ලීටර් 1 ක දියකර) නැප්සැක් ඉසිනයක් භාවිතයෙන් පැල 1000 ක් සඳහා ද්‍රාවණයෙන් ලීටර් 2 - 4 ක්	අදාල නැත
	කුමුලස් S	5940200		
	තියෝවිට් ජෙට් S	2560000		
	කොසවෙට් S	K510000		
දළු නෙලීම ආරම්භ නොකල ළපටි තේ වගාවන් සහ කප්පාදු කිරීමෙන් පසු නැවත වැඩෙන තේ වගාවන් සඳහා				
සල්ෆර් 80% Sulphur 80%	බවර්ස් S	5940100	නැප්සැක් ඉසිනයක් භාවිතා කරන්නේ නම් : 0.5% ද්‍රාවණයක් (ග්‍රෑම් 5 ක් ජලය ලීටර් 1 ක දියකර) හෙක්ටයාරයක් සඳහා කි.ග්‍රෑ. 4.5 ක් ජලය ලීටර් 600 ක මිස්ට් බ්ලෝවරයක් භාවිතා කරන්නේ නම් : 1.8% ද්‍රාවණයක් (ග්‍රෑම් 81 ක් ජලය ලීටර් 4.5 ක දියකර) හෙක්ටයාරයක් සඳහා කි.ග්‍රෑ. 4.5ක් ජලය ලීටර් 250 ක	අදාල නැත
	කුමුලස් S	5940200		
	තියෝවිට් ජෙට් S	2560000		
	කොසවෙට් S	K510000		

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	PHI (සති)
මේරූ තේ ක්ෂේත්‍ර සඳහා				
සල්ෆර් 80% Sulphur 80%	බවර්ස් S	5940100	නැප්සැක් ඉසිනයක් භාවිතා කරන්නේ නම් : 0.5% ද්‍රාවණයක් (ග්‍රෑම් 5 ක් ජලය ලීටර් 1 ක දියකර) හෙක්ටයාරයක් සඳහා කි.ග්‍රෑ. 4.5ක් ජලය ලීටර් 900 ක මිස්ට් බලෝවරයක් භාවිතා කරන්නේ නම්: 1.8% ද්‍රාවණයක් (ග්‍රෑම් 81 ක් ජලය ලීටර් 4.5 ක දියකර) මිස්ට් බලෝවරයකින් හෙක්ටයාරයක් සඳහා කි.ග්‍රෑ. 4.5ක් ජලය ලීටර් 250 ක එමෙන්ම ඉසින ලද සහ නොඉසින ලද ක්ෂේත්‍ර වල දලු 1:10 අනුපාතයට මිශ්‍ර කර ගැනීමට වගබලා ගන්න.	2
	කුමුලස් S	5940200		
	තියෝවිට් ජෙට් S	2560000		
	කොසවෙට් S	K510000		

නැප්සැක් ඉසිනයක් භාවිතා කිරීමේදී, රවුම් රටාවකට ඉතා සිහින් ජල බිඳිති නිපදවන කුහර-කේතු නැසිනයක් හෝ ඝන-කේතු නැසිනයක් සහිත නැප්සැක් ඉසිනයක් භාවිතා කරන්න. ඉසීමේදී නැප්සැක් ඉසිනවල ඉහළ පීඩනයක් (බාර් 3 ක් හෝ 42 psi) පවත්වා ගන්න.

4. කඳ විඳින ගුල්ලා පාලනය

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාම/ය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	වෙනත් කරුණු	PHI (සති)
තවාන් පැල සඳහා පූර්වාරක්ෂණ ප්‍රතිකාර					
ෆිප්‍රොනිල් 50 SC Fipronil	ෆෑන්ඩ ෆිප්‍රොනිල්	9980200	මිලි ලීටර් 5 ජලය ලීටර් 4 ක දියකර තවාන් පැළ 1000ක් සඳහා යොදන්න	කඳ ගුල්ලාට හානිකල හැකි මාස 8 - 10 ක් වයසැති තවාන් පැළවල කඳන් හා අතුවලට* ඉසින්න	අදාල නැත
	බවර්ස් ෆිප්‍රොනිල්	9980300			
හුණු සල්ෆර් මිශ්‍රණය	ලිම්බක්ස් හෝ සාමාන්‍ය හුණු (පහසුවෙන් මිශ්‍ර කර යෙදීම සඳහා පිරිසිදු හා සිහින්ව කුඩු කරන ලද හුණු) සහ කාර්මික කටයුතු සඳහා භාවිතා කරන වෙළඳපොලෙහි ඇති සියුම් කුඩු ආකාර සල්ෆර්		හුණු: සල්ෆර් 1: 1 හුණු ග්‍රෑම් 100 ක් සහ සල්ෆර් ග්‍රෑම් 100 ක් ජලය ලීටර් 4ක දියකර පැළ 1000 ක් සඳහා යොදන්න		අදාල නැත

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාම/ය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	වෙනත් කරුණු	PHI (සති)
නොමේරූ තේ වගාවන් සහ නව වගාවන් සඳහා පූර්වාරක්ෂණ ප්‍රතිකාර					
ෆිප්‍රොනිල් 50 SC Fipronil	ග්‍රෑන්ඩ් ෆිප්‍රොනිල්	9980200	<u>පළමු ඉසීම:</u> මිලි ලීටර් 200 ක් ජලය ලීටර් 250 ක දියකර නැප්සැක් ඉසිනයක් භාවිතා කර හෙක්ටයාරයකට ඉසින්න <u>දෙවන ඉසීම:</u> මිලි ලීටර් 400 ක් ජලය ලීටර් 500 ක දියකර නැප්සැක් ඉසිනයක් මගින් හෙක්ටයාරයකට ඉසින්න.	<u>පළමු ඉසීම:</u> සිටුවීමෙන් මාස 6 - 10 කට පසු, කඳ ගුල්ලාට හානිකල හැකි කඳන්/අතුවලට* ඉසින්න. <u>දෙවන ඉසීම:</u> 2වන වසරෙහි පැල වල කඳ ගුල්ලාගේ හානියට ගොදුරු විය හැකි කඳන්/අතු වලට* ඉසින්න	අදාල නැත
	බවර්ස් ෆිප්‍රොනිල්	9980300			
හුණු සල්ෆර් මිශ්‍රණය	ලිම්බක්ස් හෝ සාමාන්‍ය හුණු (පහසුවෙන් මිශ්‍ර කර යෙදීම සඳහා පිරිසිදු හා සිහින්ව කුඩු කරන ලද හුණු) සහ කාර්මික කටයුතු සඳහා භාවිතා කරන වෙළඳපොලෙහි ඇති සියුම් කුඩු ආකාර සල්ෆර්	අදාල නැත	හුණු සල්ෆර් 1:1 <u>පලමු ඉසීම:</u> සිටුවීමෙන් මාස 6-10 පසු: හුණු කි.ග්‍රෑ. 6.25ක් සහ සල්ෆර් කි.ග්‍රෑ. 6.25ක් ජලය ලීටර් 250ක දියකර නැප්සැක් ඉසිනයක් භාවිතා කර හෙක්ටයාරයකට ඉසින්න. <u>දෙවන ඉසීම:</u> 2 වන වසර පැළ සඳහා: හුණු කි.ග්‍රෑ. 12.5ක් සහ සල්ෆර් කි.ග්‍රෑ. 12.5 ක් ජලය ලීටර් 500ක දියකර නැප්සැක් ඉසිනයක් භාවිතා කර හෙක්ටයාරයකට ඉසින්න.		1

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	වෙනත් කරුණු	PHI (සති)
මේරූ තේ ක්ෂේත්‍ර සඳහා පූර්වාරක්ෂණ ප්‍රතිකාර					
හුණු සල්ෆර් මිශ්‍රණය	ලිම්බක්ස් හෝ සාමාන්‍ය හුණු (පහසුවෙන් මිශ්‍ර කර යෙදීම සඳහා පිරිසිදු හා සිහින්ව කුඩු කරන ලද හුණු) සහ කාර්මික කටයුතු සඳහා භාවිතා කරන වෙළඳපොලෙහි ඇති සියුම් කුඩු ආකාර සල්ෆර්	අදාල නැත	හුණු සල්ෆර් 1:1 හුණු කි.ග්‍රෑ. 25 ක් සහ සල්ෆර් කි.ග්‍රෑ. 25 ක් ජලය ලීටර් 1000 ක දියකර නැප්සැක් ඉසිනයක් මගින් හෙක්ටයාරයකට ඉසින්න		1

*පැන්සලක ප්‍රමාණයේ ගනකම ඇති කඳන් / අතු කඳ ගුල්ලාගේ හානියට පාත්‍රී වේ

4. කම්බිලි පණුවන්

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	PHI (සති)
ක්ලෝරන්ට්‍රානිලිප්‍රෝල් Chlorantraniliprole 200g/L SC	කොරජන්	N 620000	මිලි ලීටර් 1ක් ජලය ලීටරයක දියකර සකස් කළ ද්‍රාවණයකින්මිලි ලීටර් 200-400 ක් බැගින් නොමේරූ පැළයකට පස හොඳින් තෙමෙන සේ යොදන්න	1

5.කුහුඹුවන්

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	PHI (සති)
ඩයසිනොන් 5% G Diazinon 5% G (W/W)	ඩයිනොසර් ඩයසිනොන්	D280400	වර්ග මීටරයකට ග්‍රෑම් 10ක් යොදන්න. අවශ්‍ය නම් සති 2 කට පසු නැවත යොදන්න	1
ඩයසිනොන් 50% EC Diazinon 50% EC	ඩයසෝල් ඩයසිනොන්	C720000	මිලි ලීටර් 2ක් ජලය ලීටරයක දියකර කුහුඹුවන්ගේ කුඩුව මතට නැප්සැක් ඉසිනයකින් යොදන්න	1

6. විශේෂයෙන් සැලකිල්ලට ගතයුතු කරුණු:

පැළැටි ආරක්ෂණ ද්‍රව්‍ය භාවිතා කරන විට මුහුණු ආවරණ සහ අක්ෂි ආරක්ෂක උපකරණ ආදිය වැනි පුද්ගල ආරක්ෂක උපකරණ භාවිතයෙන් සේවකයන්ගේ ආරක්ෂාව සහතික කරන්න.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවකැලේ

ප්‍රකාශන හිමිකම

සියලුම හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අවසරයකින් තොරව මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම, ස්කෑන් කිරීම හෝ තොරතුරු ගබඩා කිරීම සහ ආපසු ලබා ගැනීම ඇතුළත්ව විද්‍යුත් හෝ යාන්ත්‍රික හෝ කිසිදු ආකාරයකින් නැවත පළ කිරීම හෝ සම්ප්‍රේෂණය කළ නොහැක.